DOI: 10.31357/fhssmph.1999.00087

# ශාන්ත සහ ප්‍රචණ්ඩ ඍෂිවරු

මහාභාරතය සහ අට්ඨකථා සාහිත්‍යය ආශ්‍රයෙන්
කරන ලද විමර්ශනයකි

29 OCT 1999

මාදුරුඔයේ ධම්මිස්සර හිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ
දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණ නිබන්ධය

29-10-1999

1999

# පිළිගැන්වීම

වරෙක මවක මෙන් ද
වරෙක පියකු මෙන් ද
කුඩා කල මා රැකබලාගත්
අධ්‍යාපන මංපෙත් විවර කරදුන්
ගල්දොල ශ්‍රී අශෝකාරාමාධිපති
අස්මදාචාර්ය පූජ්‍යපාද
දුනුකේබැද්දේ ඤාණරතනාභිධාන
මාහිමිපාණන් වහන්සේ
වෙත
සාදර ගෞරවයෙනි.

# උපකාරානුස්මෘති

- මෙම අධ්‍යයනය ආරම්භයේ සිට ම උපදේශකවරුන් වශයෙන් ද කටයුතු කරමින් තමන් කාර්යබහුල වුව ද අවශ්‍ය හැම විටෙක ම ශාස්ත්‍රීය අනුග්‍රහය දක්වූ, එපමණක් නොව විවිධ හේතු නිසා ධෛර්යය හීන වන විට දයාබර මග පෙන්වීමෙන් උත්සාහවත් කළ මහාචාර්ය මහින්ද පලිහවඩන ඇදුරුතුමනට සහ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ඇදුරුතුමනට,
- ශාස්ත්‍රපති ප්‍රථම පරීක්ෂණයෙන් සමත් වූ විට, දර්ශනපති පරීක්ෂණය සඳහා උත්තීර්ණ වීමට අවශ්‍ය සුදුසුකම් ලබා ඇති බව පෙන්වා දෙමින් ඒ සඳහා මා උත්සාහවත් කළ පශ්චාද් උපාධි පීඨයේ පීඨාධිපති මහාචාර්ය එම්.එම්. කරුණානායක ඇදුරුතුමනට,
- මෙම අධ්‍යයනයේ දී භාවිත පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ගුරුහරුකම් ලබාදුන්, මානවශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සභාපති මහාචාර්ය තිස්ස කාරියවසම් ඇදුරුතුමනට.
- අධ්‍යයන කටයුතු පිළිබඳ ව නිතර විමසමින් නියමිත කාලය තුළ දී පශ්චාද් උපාධි පරීක්ෂණයට අදාළ කටයුතු සමාප්ත කිරීම සඳහා උත්සාහවත් කළ, අවශ්‍ය කාර්යාලයීය කටයුතු විධිමත් ලෙස කරදුන්, භාෂා සහ සංස්කෘතික අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය බණ්ඩාරමැණිකේ විජේතුංග ඇදුරුතුමියට,
- අවශ්‍ය ශාස්ත්‍රීය සහ දයාබර උපදේශයන් මගින් මෙම අධ්‍යයනයේ පරිසමාප්තිය අපේක්ෂා කළ, භාෂා සහ සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ඇදුරුතුමනට සහ සමාජ හා මානවවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ඇදුරුතුමනට,
- ධෛර්යය හීන වූ අවස්ථාවක මා උත්සාහවත් කරමින් ආදරණීය වැඩිහිටියකුගේ කාර්යය ඉටු කළ, සමාජ හා මානවවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එඩ්වින් කේ. ගණේහිගම ඇදුරුතුමනට,
- නිබන්ධයේ කටයුතු අවසන් කිරීම සඳහා විවේකය අවශ්‍ය වූ විට අධ්‍යාපන කටයුතුවලින් නිදහස් කොට විවේකය ලබාදීමට කාරුණික වූ යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩඩ්ලි දිසානායක මැතිතුමාට,
- නාවින්න රාජමහාවිහාරාධිපති පූජ්‍යපාද පරදණ්ඩේ ඉන්දරතන ලොකුහාමුදුරුවන් වහන්සේ ඇතුළු විහාරවාසී මහාසංඝ රත්නයට,

- අත්පිටපත අක්ෂර සංයෝජනයෙන් පරිගණකගත කිරීමට දායක වූ කැස්බෑවේ වංසානන්ද, කැස්බෑවේ විමලානන්ද, වේපතඹර ඤාණානන්ද, කටුවන චන්ද්‍රරතන යන හිමිවරුනට, චානක අමරතුංගට ඤාණසිරි මල්ලිට සහ දමයන්ති නංගීට,
- වෛද්‍ය චන්ද්‍රසිරි වැලිවිට සහ වෛද්‍ය සනත් හෙට්ටිගේ ජීවක සහෘදයනට,
- නන් අයුරින් සහාය වූ කරඹේ රතනසාර, කැස්බෑවේ සුමනානන්ද යන හිමිවරුනට, චන්දික වේරගල ඇතුළු සහෘද ජනයනට,

පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය මෙයින් පළ කරමි.

# පටුන


පිටු අංක

සංකේත නිරූපණ VI

ඡායාරූප VII

හැඳින්වීම VIII – XIII

## ප්‍රථම පරිච්ඡේදය 1–58

1.1 පසුබිම
1.2 හින්දූසමය සහ බුදුසමය
1.3 ශ්‍රමණ සම්ප්‍රදාය
1.3.I ඍෂිවරුන් පිළිබඳ ඉතිහාසය
1.3.II අර්ථකථන
1.3.III තාපස
1.4 ඍෂිවරු
1.4.I අර්ථකථන
1.4.II තාපස සහ මුනි
1.4.III ඍෂිවරුන් හා මුනිවරු
1.4.IV ඍෂිවරුන් වර්ග කිරීම
1.4.V සප්තර්ෂීහු
1.4.VI ඍෂි පරපුර

## ද්විතීය පරිච්ඡේදය 59–122

2.1 පොදු උරුමය
2.1.I භෞමික පරිසරය
2.1.II කථා පද්ධතිය
2.2 විශේෂතා
2.2.I ගෘහස්ථ ජීවිතය සහ පැවිදි ජීවිතය
2.2.II තපස සහ සීලය
2.2.III ධර්මය සහ ස්වධර්මය
2.2.IV පුනරුත්පත්තිය සහ කර්මය
2.2.V ස්වර්ගය සහ දිව්‍යලෝකය
2.2.VI භගවද්ගීතාව, අනාසක්තකර්මයෝගය සහ මෝක්ෂය

තෘතීය පරිච්ඡේදය 124–174

3.1. අරමුණ අනුව කථා ගැළපීම
3.1.I ද්‍රෞපදී ස්වයංවරය
3.1.II කුණාල ජාතකයේ එන කථාව
3.2. විශේෂතා ප්‍රකට කිරීම
3.2.I ගෘහස්ථ ජීවිතය සහ පැවිදි ජීවිතය
3.2.II ඍෂ්‍යශෘංගෝපාඛ්‍යානය
3.2.III අලම්බුසා ජාතකය
3.2.IV නලිනිකා ජාතකය
3.3. තපස සහ සීලය
3.3.I ශක්‍ර සහ ඍෂිවරු
3.3.II සුරාසුර යුද්ධය
3.3.III ච්‍යවනොපාඛ්‍යානය
3.3.IV අකිත්ති ජාතකය
3.4 ධර්මය සහ වර්ණධර්මය
3.5 පුනරුත්පත්තිය සහ කර්මය
3.6 ස්වර්ගය, බ්‍රහ්ම ලෝකය සහ මෝක්ෂය

චතුර්ථ පරිච්ඡේදය 176–232

4.1 තපස සහ මෛථුන සේවනය
4.2 ක්‍රෝධය සහ තපස
4.3 ඍෂි ජීවිතය සහ කාන්තාව
4.4 ශාන්ත ඍෂිවරුන් දුර්ලභ බව

පඤ්චම පරිච්ඡේදය 233–242

සමෝධානය

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 243–247

සූචිය 248–263

# සංකේත නිරූපණ

අථර්ව - අථර්වවේදසංහිතා

අංනි. - අංගුත්තරනිකාය

අංනි.අට්ඨ. - අංගුත්තරනිකායට්ඨකථා

අපදාන - අපදානපාළි

අපදාන.අට්ඨ. - අපදානට්ඨකථා

උදාන.අට්ඨ. - උදානට්ඨකථා

ඍග්. - ඍග්වේදසංහිතා

ඓඋ. - ඓතරේය උපනිෂද්

කෞෂිඋ. - කෞෂිතකී උපනිෂද්

චරියාපිටක - බුද්ධවංස, චරියාපිටකපාළි

චරියා.අට්ඨ - චරියාපිටකට්ඨකථා

චුල්ලනිද්දෙස. - චුල්ලනිද්දෙසපාළි

චුල්ලනිද්දෙස.අට්ඨ. - චුල්ලනිද්දෙසට්ඨකථා

ඡාඋ. - ඡාන්දෝග්‍ය උපනිෂද්

ජතක. - ජාතකපාළි

ජාතක.අට්ඨ. - ජාතකට්ඨකථා

තෛඋ. - තෛත්තිරීය උපනිෂද්

ථෙර. - ථෙරගාථාපාළි

ථෙර.අට්ඨ. - ථෙරගාථාට්ඨකථා

දීනි. - දීඝනිකාය

දීනි.අට්ඨ. - දීඝනිකායට්ඨකථා

දීනි.ටීකා. - දීඝනිකාය ටීකා

ධම්මපද. - ධම්මපදපාළි

ධම්මපද.අට්ඨ. - ධම්මපදට්ඨකථා

නෙත්ති.අට්ඨ. - නෙත්තිප්පකරණට්ඨකථා

පෙතවත්ථු.අට්ඨ. - පෙත්වත්ථු අට්ඨකථා

බුද්ධවංස. - බුද්ධවංසපාළි

බුද්ධවංස.අට්ඨ. - බුද්ධවංසට්ඨකථා

බෘඋ. - බෘහදාරණ්‍යක උපනිෂද්

මනි. - මජ්ඣිමනිකාය

මනි.අට්ඨ. - මජ්ඣිමනිකායට්ඨකථා

මනු. - මනුස්මෘති

මහා. - මහාභාරතය

මහානිද්දෙස. - මහානිද්දෙසපාළි

මහානි.අට්ඨ. - මහානිද්දේසට්ඨකථා

මහාවග්ග. - මහාවග්ගපාළි

මුඋ. - මුණ්ඩක උපනිෂද්

රාමා. - රාමායණ

විභඞ්ග.අට්ඨ. - විභඞ්ගට්ඨකථා

විමාන.අට්ඨ. - විමානවත්ථු අට්ඨකථා

සමන්තපා. - සමන්තපාසාදිකා

සංනි. - සංයුත්තනිකාය

සංනි.අට්ඨ. - සංයුත්තනිකායට්ඨකථා

සුනි. - සුත්තනිපාතපාළි

සුනි.අට්ඨ. - සුත්තනිපාතට්ඨකථා

EB = Encyclopaedia of Buddhism

ERE = Encyclopaedia of Religion and Ethics

Radha = Radhakrishnan

## ඡායාරූප

1. මොහෙන්ජොදාරෝවේ මහා නාන කිළිය — 3 පිටුව
(අසිරිමත් ඉන්දියාව 3 පිටුව)

2. 'පූජක රජුගේ' හෝ දෙවියකුගේ යැ යි සැලකෙන 'ගල් හිසක්' සහ යෝගියකුගේ ස්වරූපය ප්‍රකාශිත මුද්‍රාවක් — 4 පිටුව
(ආදි ඉන්දියාව සහ පාකිස්ථානය 227 පිටුව)

# හැඳින්වීම

'සියලු සත්ත්වයනට රාත්‍රිය වන විට සන්හුන්

ඉඳුරන් ඇති සෘෂිවරයා අවදියෙන් සිටියි.'

'යා නිශා සර්වභූතානාං තස්‍යාං ජාගර්ති සංයමී' (මහා.VI.26.69.)

මානව සමාජයේ සාමාජිකයනට දේශ–කාල භේදයකින් තොර ව ජීවන ගැටලු මතු වෙයි. ඒ ඒ ස්තර අනුව ගැටලුවල ස්වභාවය විවිධ වෙයි. වඩාත් පුළුල් අර්ථයකින් ගත් විට සියලු සත්ත්වයනට ම ගැටලු ඇති වෙයි. එම ගැටලුවලට මුහුණ දීමේ දීත් ඒවා විසඳාගැනීමේ දීත් ඒ ඒ සත්ත්වයන් විසින් අනුගත ක්‍රියාමාර්ගවල විවිධතා දක්නට ලැබෙයි.

මිනිසා තමාට උද්ගත වන ගැටලු නිරාකරණය කරගැනීමේ දී වඩාත් සංවිධානාත්මක වෙයි. මානව කණ්ඩායමක් සම්බන්ධයෙන් ගත් විට එය මනා ව පැහැදිලි වන කරුණකි. සියලු දෙනාට ම ගැටලු නිරාකරණය කරගැනීමේ බුද්ධි ශක්තියක්, විවේක ඥානයක් නොමැති බැවින් ඒ සඳහා සුවිශේෂ පුද්ගලයන් බිහි වෙයි.

අනෙක් අයට වඩා හොඳින් 'දකින්නා' යන අර්ථයෙන් ඔවුන් 'සෘෂි' යනුවෙන් හැඳින්වූවා විය හැකි ය; අවශ්‍ය විවේක ඥානයෙන් යුක්ත ව නො ඇලී 'ගමන් කරන' අර්ථයෙන් 'සෘෂි' යනුවෙන් හැඳින්වූවා ද විය හැකි ය. එය කෙසේ සිදු වුවත් ආරම්භක අවස්ථාවක් පිළිබඳ සටහනක් තැබිය නොහැකි තරමට සෘෂි ජීවිතයේ ආරම්භය පැරණි ය.

ඍෂි සංකල්පය වර්ධනය වන විට 'දෙවියන් දකින්නා' යන අර්ථයෙන් 'ඍෂි' යන්න යෙදුණු බව දැකගත හැකි ය. ඒ අනුව මේ සංකල්පය ක්‍රමයෙන් වර්ධනය වෙමින් සමාජ අවශ්‍යතාවක් ලෙස පැවතුණි. එකී වර්ධනය ඇතැම් විටෙක කොතරම් කැපී පෙනුණේ ද යත් කලෙක දෙවියනට ස්තෝත්‍ර ගායනය කරමින් සිටි ඍෂිවරුන් පසු කලෙක දෙවියන් විසින් පුදනු ලබන අයුරු දක්නට ලැබේ.

අවශ්‍ය දෙය පමණක් කථා කරන යන අර්ථයෙන් හෝ අවශ්‍ය අවස්ථාවේ දී පමණක් කථා කරන යන අර්ථයෙන් හෝ ඒ ඍෂිවරු 'මුනි' නාමයෙන් ද හඳුන්වනු ලබති. වනගත ව 'තපෝ' කර්මයන්හි යෙදුණ ඔවුන් සතු ව පැවති බලයට බලගතු දෙවියන් පවා නතු වන බවට විශ්වාස කෙරිණ.

සංවිධානාත්මක සමය සම්ප්‍රදායන් තුළ ද මේ ඍෂි සංකල්පය ඒ ඒ සම්ප්‍රදායට ගැළපෙන අර්ථකථන සමග භාවිත විය. විශේෂයෙන් හින්දුසමය තුළත් බුදුසමය තුළත් බොහෝ ඍෂිවරුන් දැකගත හැකි ය. අතීතයේ විසූ ඍෂිවරුන් පිළිබඳ ව දැනගැනීම හැම කල්හි ම ඍෂිවරුනට පමණක් නො ව සමස්ත සමාජයට ම වැඩදායක වෙයි. එවැනි අර්ථයකින්, පැරණි ඍෂිවරුන් පිළිබඳ ව ඉදිරිපත් කරන ලද කථා රාශියක් හින්දුසමයට අයත් මහාභාරතය තුළත් බුදුසමයට අයත් අට්ඨකථා තුළත් සංග්‍රහ වී ඇත. එම සංග්‍රහ තුළ ඇතැම් විටෙක පැරණි ඍෂිවරයකු පිළිබඳ කථාවක් ඉදිරිපත් කළේ ඒ වන විට ඍෂි ජීවිතයක් ගත කළ අයකුට ඇති වූ ගැටලුවක් නිරාකරණය කරගැනීමට රුකුලක් වශයෙනි.

වර්තමාන මානව සමාජය තුළ දක්නට ලැබෙන ගැටලු මෙයට වසර දහස් ගණනකට පෙර පැවති සමාජයක ඇති වී යැ යි සඳහන් වන ගැටලුවලින් වෙනස් වන්නේ නම් ඒ මතුපිටින් පෙනෙන ස්වරූපය වශයෙන් පමණි. වෙනස් අර්ථකථන

දිය හැකි වුවත් ගැටලුවත් ඊට පාදක වූ හේතුවත් අතීත ගැටලුවලින් වෙනස් නොවන බව දකගත හැකි වෙයි.

මහාභාරතය තුළත් අට්ඨකථා තුළත් අන්තර්ගත කථා සම්භාරය ඉතා විශාල ය. එම කථා සම්භාරය අතුරින් මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරුණේ ඍෂිවරුන් සම්බන්ධ කථා පද්ධතිය වෙත ය. එහි දී හමු වූ ඍෂිවරුන්ගේ සංඛ්‍යාව ඉතා විශාල වූ බැවින් අධ්‍යයනයේ අරමුණ සාක්ෂාත් කරගැනීමේ සීමාව සහ නිබන්ධයේ සීමාව ඉක්මවා නොයනු පිණිස අදාළ ප්‍රධාන ඍෂිවරුන් පිළිබඳ කථා වෙත පමණක් යොමු වීමට සිදු විය.

මහාභාරත සංස්කරණ කිහිපයක් ම වෙයි. ගෝර්ඛ්පූර්හි 'ගීතාප්‍රෙස්' මගින් පළ කරන ලද සංස්කරණය මෙම අධ්‍යයනය සඳහා ආශ්‍රිත ය. මහාභාරතයේ ඇතැම් කරුණු නිරාකරණය කරගැනීමේ දීත් ඍෂිවරුන් පිළිබඳ කථාවන්හි සම්බන්ධය ගොඩනගාගැනීමේ දීත් Sorensen ගේ An Index to the Names in the Mahabharata කෘතිය බෙහෙවින් උපකාරී විය. තව ද Edward P. Rice ගේ The Mahabharata කෘතිය ද පරිශීලනය කරන ලදි. 'හේවාවිතාරණ සංස්කරණ' නමින් ප්‍රසිද්ධ ව ඇති අට්ඨකථා සංස්කරණ මෙම අධ්‍යයනය සඳහා ආශ්‍රිත අට්ඨකථා ය.

මෙම නිබන්ධය පරිච්ඡේද පහකින් සමන්විත ය. පස්වම පරිච්ඡේදය සමෝධානය වශයෙන් ඉදිරිපත් කර ඇත.

ප්‍රථම පරිච්ඡේදය *හින්දු-බෞද්ධ සම්ප්‍රදායද්වයෙහි නිරූපිත ඍෂිවරුන් සහ මුනිවරු* යනුවෙන් හඳුන්වා ඇත. සින්ධු නදී නිම්නය ආශ්‍රිත ව ක්‍රි.පූ.1500 වර්ෂයට කලින් තහවුරු ව පැවති සංස්කෘතික සම්ප්‍රදායන් බටහිරින් පැමිණි නව ජනතාවක් නිසා විනාශ වෙයි. ඒ මත නව ශිෂ්ටාචාරයක් ගොඩනැගෙන අතර එතෙක් පැවති

too simplistic

ශිෂ්ටාචාරයේ අවශේෂ සහ නව ශිෂ්ටාචාරය අතර නොයෙක් විට ගැටුම් ඇති වෙයි. නව ශිෂ්ටාචාරය බලසම්පන්න වුව ද පැරණි ශිෂ්ටාචාරය සහමුලින් ම නැති කර දැමිය නොහැකි වෙයි. පැරණි ශිෂ්ටාචාරයට අයත් ව පැවති විවිධ ආගමික සම්ප්‍රදායන් නොයෙක් වර නැගී සිටින්නට වීම නිසා ඍග්වේද ආදි සංග්‍රහ මගින් සිය ආගම රැකගැනීමට නව ශිෂ්ටාචාරය කටයුතු යොදයි. පසු ව ප්‍රධාන වශයෙන් මේ ශිෂ්ටාචාර දෙක ම එකතු වීමෙන් නව ආගමක් බිහි වෙයි. වර්තමානයේ හින්දුසමය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මේ ආගම යි. එසේ වුවත් එම ආගම සම්බන්ධ නිශ්චිත ආරම්භයක් දක්විය නොහැකි වෙයි. ඉහත කී ගැටුම පවත්නා අතරතුර පැරණි ශිෂ්ටාචාරයට අයත් යේ සැලකිය හැකි ශ්‍රමණ සම්ප්‍රදාය තුළින් ද නව චින්තන ධාරාවන් බිහිවන්නට වෙයි. එලෙස බිහි වී ප්‍රබල ලෙස වැඩී ගිය එක් සම්ප්‍රදායකි, ගෞතම බුදුරදුන්ගේ දේශනා තුළින් බිහි වී වැඩුණු බුදුසමය. එකී සම්ප්‍රදාය දෙක තුළ, එනම් හින්දු සම්ප්‍රදාය තුළත් බෞද්ධ සම්ප්‍රදාය තුළත් ඍෂි/ඉසි නමින් හැඳින්වෙන විශේෂ පිරිසක් දක්නට ලැබෙයි. එම පිරිස හඳුනාගැනීම මෙම පරිච්ඡේදයේ අරමුණ යි.

ද්විතීය පරිච්ඡේදය *බෞද්ධ – හින්දු සම්ප්‍රදායද්වයේ පොදු උරුමය සහ විශේෂතා* යනුවෙන් හඳුන්වා ඇත. ආරම්භයක් හෝ ආදිකර්තෘවරයකු පෙනෙන්නට නැති හින්දුසමයත් බුදුරදුන්ගේ දේශනාවලින් ඇරඹී වර්ධනය වූ බුදුසමයත් භාරතයේ එක ම භෞමික පරිසරයක් ඇතුළත විකසිත වූ බව නිශ්චිත ය. මේ පරිසරය බෞද්ධ සාහිත්‍යයෙහි සොළොස් මහ ජනපද ලෙසත් හින්දු සංස්කෘත සාහිත්‍යයෙහි මධ්‍යදේශය ලෙසත් නිරූපිත ය. මෙහි දළ වශයෙන් පුරාණතම උපනිෂද් ග්‍රන්ථයන්ගේ කාලයේ සිට ක්‍රිස්තු වර්ෂයෙන් 2 වැනි සියවස පමණ තෙක් විහිදි චකවානුවෙහි පැතුළ වූ පොදු ආගමික/දාර්ශනික ප්‍රවණතාවන් රාශියක් පැතිරී ගිය බවට සාක්ෂ්‍ය මහත් රාශියකි. ඍග්වේදය ආදි කෘතීන්හි පැනෙන බහුල වශයෙන් ලෞකික ප්‍රාර්ථනාවන්ට ද ඒවා සාක්ෂාත් කරගැනීමේ

මාර්ගය ලෙස යඥයට (කර්මමාර්ගයට) ද ලැබී තුබුණ වැදගත්කම මෙම චකවානුවෙහි හීන වන්නට පටන් ගනියි. ඒ වෙනුවට විශ්වයත් පුද්ගලයාත් පිළිබඳ ප්‍රකට අත්දැකීම්වලින් එහා පවතින යථාර්ථය සෙවීමේ ප්‍රවණතාවක් වෛදික සම්ප්‍රදාය තුළ ම ඉස්මතු ව ඇති සැටි උපනිෂද් කෘතිවලින් අපට දැකගත හැකි ය. මේ සත්‍ය ගවේෂණයට එළඹෙන තැනැත්තා සියලු කායික යැපයම්පත් අත් හැර දැමීමට බිය නො වෙයි; පිළිගත් දෘෂ්ටීන් විමර්ශනයට ලක් කිරීමට බිය නො වෙයි. මෙබඳු ගවේෂණ තුළින් භාරතයේ සනාතන ධර්මයේ මූලික ලක්ෂණ වන ආත්මාවබෝධය (-බ්‍රහ්මාවබෝධය) හෙවත් ඥාන(ප්‍රඥා) මාර්ගය, ඊට ම තවත් ප්‍රවේශයක් වන යෝග (සමාධි/භාවනා) මාර්ගය, කර්ම, සංසාර, මෝක්ෂ, ආදි සාකල්‍යයෙන් ම භාරතයට විශේෂ වූ ආගමික/දාර්ශනික සංකල්ප යන මේ හැමෙකක් ම ප්‍රාදුර්භූත විය. මේ සියල්ල පොදු භාරතීය ලෝක දෘෂ්ටියක් ප්‍රකට කරයි. චාර්වාක දර්ශනය හැර අන් සියලු භාරතීය ආගම්වලට ඒවා සාධාරණ ය. ඒ සමග ම බුදුසමය, හින්දුසමය යනාදි හැම සම්ප්‍රදායක් තුළ ම මේ ප්‍රවණතා එක එකට සුවිශේෂ වූ ආකාරයකින් විකාශනය වූ බව ද අවිවාදයෙන් පිළිගත හැකි කරුණකි. මෙම පරිච්ඡේදයේ අරමුණ වනුයේ මෙකී කරුණු තවදුරටත් පැහැදිලි කරලීම ය.

තෘතීය පරිච්ඡේදය *විශේෂතා සාථා තුළ පිළිබිඹු වන අයුරු* යනුවෙන් හඳුන්වා ඇත. හින්දුසමය ආත්මවාදී පදනමක පිහිටා ඇති බවත් බුදුසමය අනාත්මවාදී පදනමක පිහිටා ඇති බවත් ප්‍රකට සත්‍යයකි. එක් එක් සම්ප්‍රදාය පිහිටා ඇති පදනම අනුව ගත් විට නිරන්තර ප්‍රතිවිරෝධතා මතු විය හැකි වුවත් හැම විටෙක ම එය එසේ සිදු නො වෙයි. 'විමුක්තිය ලැබීම අවශ්‍ය ය' යන්න සම්ප්‍රදායද්වයට ම පොදු ලක්ෂණයකි. එසේ වුවත් විමුක්තිය සහ විමුක්තිය සාධා ගැනීමේ මාර්ගය වශයෙන් ගත් විට ඒ ඒ සම්ප්‍රදාය විශේෂතා ප්‍රකට කරයි. ගෘහස්ථ – ප්‍රව්‍රජිත ජීවිත සම්බන්ධයෙන් ද එබඳු විශේෂතා දක්නට ලැබෙයි.

ස්වධර්ම සංකල්පය යටතේ වර්ණ හෙවත් කුල තහවුරු කිරීම සහ පුද්ගල ස්වාධීනතාව පිළිගනිමින් වර්ණ ප්‍රතික්ෂේප කිරීමත් සම්ප්‍රදායද්වයෙහි විශේෂතා පිළිබිඹු කරන තවත් කරුණකි. කථා මගින් තම සංකල්ප ප්‍රචලිත කිරීමට සම්ප්‍රදායද්වය ම කටයුතු කළේ ය. එසේ භාවිත කථා තුළ ඉහත කී ආකාර විශේෂතා නිරූපණය වී ඇති අයුරු විමර්ශනය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ යි.

චතුර්ථ පරිච්ඡේදය *සෘෂිවරුන් සහ මුනිවරුන් පිළිබඳ කථාවලින් මතු වන ප්‍රධාන ගැටලු* යනුවෙන් හඳුන්වා ඇත. මහාභාරතය එක ම කරුණක් දෙස විවිධ දෘෂ්ටි කෝණවලින් බලන ලද බවක් ඉදිරිපත් කර ඇති කථා පද්ධතිය තුළින් දක්නට ලැබේ. එක ම කරුණක් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් තවත් තැනෙක දී සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප වන තරමට එකී විවිධතාව දක්නට ලැබෙයි. එබඳු පරස්පර විරෝධතා පැනනැගෙනුයේ ඉහත පරිච්ඡේදවල දී දක්නට ලැබුණ පරිදි හින්දු සම්ප්‍රදායට බාහිර වෙනත් සම්ප්‍රදායන් විසින් භාවිත කථා සහ සංකල්ප හින්දුසමය තුළට අන්තර්ග්‍රහණය කරගැනීමේ ප්‍රතිඵලයක් ද වශයෙනි. විශේෂයෙන් ගෘහස්ථ ද නොවන ප්‍රව්‍රජිත ද නොවන ජීවිත ගත කළ අය සේ පෙනෙන සෘෂිවරුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී මහාභාරතය එකී පරස්පර විරෝධතාවන්ගෙන් ගහණ වෙයි. එකී විරෝධතා සහ ඒ තුළින් මතු වන ගැටලු පිළිබඳ විග්‍රහයක් කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ යි.

# ශාන්ත සහ ප්‍රචණ්ඩ සෘෂිවරු

## ප්‍රථම පරිච්ඡේදය